*සැ. යු.* - 2021.12.10 දින පළවූ අංක 2258 ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 2,258 - 2021 දෙසැම්බර් මස 17 වැනි සිකුරාදා - 2021.12.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 278 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 283 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 ජනවාරි මස 07 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 දෙසැම්බර් මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


277 - B 82297 - 353 (2021/12)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

වයඹ පළාත් සභාවේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ජේ. ඒ. විජානි වසන්තිකා වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1997.11.12 වැනි දින ප්‍රදානය කර ඇති අංක පුත්/ප්‍ර 27724 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන කිර්තිසිංහගම පදිංචි උඩුමලගල උලුවිටිගේ ප්‍රියදර්ශිකා නානායක්කාර වෙත ප්‍රදානය කොට පුත්තලම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක L.D.O 45/210 යටතේ 1995.11.15 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නිත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2022.01.03 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කයේ, මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පුත්තලම් පත්තුවේ, 609 මදුරන්කුලිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කීර්තිසිංහගම නැමැති ගමේ පිහිටා ඇත්තාවූ ප්‍රමාණයෙන් රූඩ් දෙකක් (රූඩ් 02) විශාලත්වය ඇත්තාවූ ද පහත පරිදි මායිම්වන රජයේ ඉඩම :

*උතුරට* : ප්‍රධාන පාර,
*නැගෙනහිරට* : කේ. ජී. නිමල්ගේ ඉඩම,
*දකුණට* : කුවින්ටස්ගේ ඉඩම,
*බස්නාහිරට* : බවුම් පාර.

ජේ. ඒ. විජානි වසන්තිකා,
ප්‍රාදේශීය ලේකම්,
මුන්දලම.

2021 අප්‍රේල් මස 12 වැනි දින.

12-459/1

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

වයඹ පළාත් සභාවේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩබ්. ඒ. එස්. සී. ජී. ජාන්ස වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.03.29 වැනි දින ප්‍රදානය කර ඇති අංක පුත්/ආර/ප්‍ර 29284 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන බංගදෙණිය, ගම්කැලේ පදිංචි වීරසිංහ මූලාචාරිගේ ජුවන් නයිදේ වෙත ප්‍රදානය කොට හලාවත දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ආර 21/95 යටතේ 1996.10.10 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නිත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2022.01.03 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කයේ, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුන්නේශ්වරම් පත්තුවේ/ කෝරළේ, වීරකුමන්දළුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ගම්කැලේ නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද අංක පු. 3492 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 12 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර බින්දුවයි දශම තුනයි නවයයි හයයි බින්දුවක් (හෙක්. 0.3960) විශාලත්වය ඇත්තාවූ ද පහත පරිදි මායිම්වන රජයේ ඉඩම :

*උතුරට* : පු. 3492 හි කැබලි අංක 11 සහ 02,
*නැගෙනහිරට* : මූ. පි. 4845/2,
*දකුණට* : පු. 3492 හි කැබලි අංක 17,
*බස්නාහිරට* : පු. 3492 හි කැබලි අංක 02 ගම්සභා මාර්ගය.

ඩබ්. ඒ. එස්. සී. ජී. ජාන්ස,
සහකාර ප්‍රාදේශීය ලේකම්,
ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් වෙනුවට.

2019 පෙබරවාරි මස 20 වැනි දින.

12-459/2

ඇමුණුම 09

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

වයඹ පළාත් සභාවේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් යූ. එස්. එන්. ප්‍රනාන්දු වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995 නොවැම්බර් හයවන දින ප්‍රදානය කර ඇති අංක පුත්/වෙන්/ප්‍ර/23637 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන ලුණුවිල, කිරිමැටියානවත්ත ජනපදයේ පදිංචි මිහිඳුකුලසූරිය කල්‍යාණ ප්‍රසන්න පෙරේරා වෙත ප්‍රදානය කොට මාරවිල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක පුත්/වෙන්/21/92 යටතේ 1995.12.12 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නිත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2022.01.03 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

පුත්තලම දිස්ත්‍රික්කයේ, වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දකුණු පිටිගල් කෝරලේ නැගෙනහිර ලුණුවිල, ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ලුණුවිල නැමැති ගමේ පිහිටා ඇති සර්වේ ජනරාල් විසින් සම්පාදිත අංක 52/13/1,2 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි පුත්තලම මැනුම් අධිකාරි විසින් සම්පාදිත අංක මූ. පී. පූ. 3363 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 45 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම්කොට ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් බින්දුවයි දශම බින්දුවයි දෙකයි හයක් (0.026) විශාල කිරිමැටියානවත්ත නැමැති රජයේ ඉඩම :

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 44 සහ 43, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 46 සහ 57, |
| *දකුණට* | : | කැබලි අංක 58, |
| *බස්නාහිරට* | : | ලුණුවිල සිට නිවාස දක්වා ඇති පාර. |

යූ. එස්. එන්. ප්‍රනාන්දු,
ප්‍රාදේශීය ලේකම්,
වෙන්නප්පුව.

2020 ඔක්තෝබර් මස 06 වැනි දින.

12-459/3

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

වයඹ පළාත් සභාවේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් හර්ෂන ජයසිරි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.08.06 දින ප්‍රදානය කර ඇති අංක පුත්/නව/ප්‍ර/ 44913 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන වෙලේවැව, නවගත්තේගම පදිංචි හේරත් මුදියන්සේලාගේ පියසේන කරුණාවති වෙත ප්‍රදානය කොට පුත්තලම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්.ඩී.ඕ.269/30 යටතේ 2005 සැප්තැම්බර් 14 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2022.01.14 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කයේ, නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිරිමැටියාව පත්තුවේ/ කෝරලේ 646-2/වෙලේවැව දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ වෙලේවැව නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, පුත්තලම මිනින්දෝරු අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ.ග.පි. 3216 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක 663 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම්කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.212 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ගොඩ ඉඩම :

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 662 හා 653, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 662 හා මාර්ග රක්ෂිතය, |
| *දකුණට* | : | කැබලි අංක 664 හා 665, |
| *බස්නාහිරට* | : | කැබලි අංක 664 හා 653. |

හර්ෂන ජයසිරි,
ප්‍රාදේශීය ලේකම්,
නවගත්තේගම.

2021 ජනවාරි මස 22 වැනි දින.

12-459/4

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

වයඹ පළාත් සභාවේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් ජේ. ඒ. විජානි වසන්තිකා වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1986.07.02 දින ප්‍රදානය කර ඇති අංක පුත්/ප්‍ර 6654 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන නවදන්කුලම, මංගලඑලිය පදිංචි ලියනගේ සිම්යොන් අප්පුහාමි වෙත ප්‍රදානය කොට පුත්තලම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක L.D.O. 8/247 යටතේ 1989.04.19 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2022.01.03 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කයේ, මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පුත්තලම් පත්තු සහ කඩවත් පත්තුවේ 610/බී නවදන්කුලම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නවදන්කුලම නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක පි.පි.පු 163 දරන පිඹුරේ, අංක 39 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර දෙකයි පර්චස් විසිතුනක් (අක්කර 02 පර්චස් 23) විශාලත්වය ඇත්තාවූ ද පහත පරිදි මායිම් වන රජයේ ඉඩම :

| | | |
|---|---|---|
| *උතුරට* | : | රජයේ කැලෑව, |
| *නැගෙනහිරට* | : | රජයේ කැලෑව, |
| *දකුණට* | : | පාර, |
| *බස්නාහිරට* | : | රජයේ කැලෑව. |

ජේ. ඒ. විජානි වසන්තිකා,
ප්‍රාදේශීය ලේකම්,
මුන්දලම.

2020 නොවැම්බර් මස 11 වැනි දින.

12-459/5

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

වයඹ පළාත් සභාවේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහකාර ප්‍රාදේශීය ලේකම් ඩබ්. ඒ. එස්. සී. ජී. ජන්ස වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1987.01.29 දින ප්‍රදානය කර ඇති අංක පුත්/ප්‍ර 8238 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන වෛරන්කට්ටුව පදිංචි නුගේගොඩගේ තෝමස් සිල්වා වෙත ප්‍රදානය කොට හලාවත දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ආර 5/541 යටතේ 1991.09.27 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2022.01.03 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කයේ, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ආනවිලුන්දන් පත්තුවේ ආරච්චිකට්ටුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, වයිරන්කට්ටුව නැමැති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක පිපිපු. 2567 දරන පිඹුරෙහි අංක 12 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර දෙකයි දශම බින්දුවයි හතරයි හතක් (හෙක්. 2.047) ඇතැයි ගණන් බලා තිබෙන වයිරන්කට්ටුව කැලේ යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය :

| | | |
|---|---|---|
| *උතුරට* | : | කට්ටි අංක 01 සහ 131 පාර, |
| *නැගෙනහිරට* | : | කට්ටි අංක 131 පාර, |
| *දකුණට* | : | කට්ටි අංක 14, |
| *බස්නාහිරට* | : | කට්ටි අංක 146 පාර. |

ඩබ්. ඒ. එස්. සී. ජී. ජාන්ස,
සහකාර ප්‍රාදේශීය ලේකම්,
ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් වෙනුවට.

2021 ජනවාරි මස 22 වැනි දින.

12-459/6

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

වයඹ පළාත් සභාවේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ජේ. ඒ. විජානි වසන්තිකා වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1987.07.03 වැනි දින ප්‍රදානය කර ඇති අංක පුත්/ප්‍ර 8550 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන සංදිතෝට්ටම් පදිංචි කිරිබංඩා ආරච්චිලාගේ දොන් මල්ලිකා ජසින්තා වෙත ප්‍රදානය කොට හලාවත දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක L.D.O 2/ආ/209 යටතේ 1990.03.06 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නිත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2022.01.03 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කයේ, මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ආනවිලුන්දන් පත්තුවේ, 593 පුලිච්චිකුලම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ සංදිතෝට්ටම් නැමැති ගමේ පිහිටා ඇත්තා වූ අංක මු.පි.පු. 2702 දරන පිඹුරේ කට්ටි අංක 40 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපිත ප්‍රමාණයෙන් හෙක්ටයාර් බින්දුවයි දශම බින්දුවයි නමයයි හතක් (0.097) විශාලත්වය ඇත්තාවූ ද පහත පරිදි මායිම්වන රජයේ ඉඩම :

| | | |
|---|---|---|
| *උතුරට* | : | කට්ටි අංක 10 සහ 11 කොටසක්, |
| *නැගෙනහිරට* | : | කට්ටි අංක 39, |
| *දකුණට* | : | කට්ටි අංක 54 පාර, |
| *බස්නාහිරට* | : | කට්ටි අංක 54 පාර. |

ජේ. ඒ. විජානි වසන්තිකා,
ප්‍රාදේශීය ලේකම්,
මුන්දලම.

2021 අප්‍රේල් මස 12 වැනි දින.

12-459/7

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

මධ්‍යම පළාත් සභාවේ, මාතලේ දිස්ත්‍රික්කයේ, යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩී. ආර්. කේ. හෙන්නායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982.02.26 වැනි දින ප්‍රදානය කර ඇති අංක මාතලේ/ප්‍ර/115 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 40, දුල්ලෑව 1, වාලවෙල පදිංචි මීරා ලෙබ්බේ මොහමඩ් හනීෆා මහතා වෙත ප්‍රදානය කොට මාතලේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කර්යාලයේ අංක දූ/5/07 යටතේ 1982/09/06 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2022 ජනවාරි 03 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

මාතලේ පරිපාලන දිස්ත්‍රික්කයේ, යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අස්ගිරි උඩසිය පත්තුවේ, දුල්ලෑව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ දුල්ලෑව නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද මාතලේ මැනුම් අධිකාරි භාරයේ ඇති සහ සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අයි 15/36 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි මා/110 කට්ටි කැඩීමේ පිඹුරේ අංක 40 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම්කොට ඇත්තා වූ, ප්‍රමාණයෙන් රූඩ් දෙකක විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද, රජයේ ඉඩම දූල්ලෑව 1 ජනපදය, කැබලි අංක 40

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඇල (කැබලි අංක 37), |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 42, |
| *දකුණට* | : | කැබලි අංක 41, |
| *බස්නාහිරට* | : | අඩි පාර (කැබලි අංක 39). |

ඩී. ආර්. කේ. හෙන්නායක,
ප්‍රාදේශීය ලේකම්,
යටවත්ත.

2021 ජනවාරි 06 මස වැනි දින.

12-522/1

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් මොනරවිල කසුන් ප්‍රභාත් ආරියරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1988.09.30 වැනි දින ප්‍රදානය කර ඇති අංක මාතලේ/ප්‍ර/8895 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ගලේවෙල, හොම්බාව පදිංචි රාජමුණි දේවයලාගේ හෙරානිස් වෙත ප්‍රදානය කොට මාතලේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක හො/281/578/90 යටතේ 1990.10.19 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නිත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2022 ජනවාරි 03 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

මාතලේ පරිපාලන දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දපල්ල කෝරළේ බෙලිගමුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ හොම්බාව නැමැති ගමේ පිහිටා ඇති සර්වේයර් ජනරාල්වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක අ.ග.පි. 335 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 566 හා 570 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපනය කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.810 ක් ඇතැයි ගණන් බලා තිබෙන හොම්බාව ජනපදය යනුවෙන් හඳුන්වනු ලබන පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම් කට්ටිය :

කැබලි අංක 566 (හෙක්ටයාර් 0.040)

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 565 හා 569, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 565 හා 546, |
| *දකුණට* | : | කැබලි අංක 546, 570 හා 291 1/2, |
| *බස්නාහිරට* | : | කැබලි අංක 570 හා 569. |

කැබලි අංක 570 (හෙක්ටයාර් 0.770)

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 569 හා 505, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 566, 565, 291 1/2 හා 571, |
| *දකුණට* | : | කැබලි අංක 571, 291 1/2 හා 36, |
| *බස්නාහිරට* | : | කැබලි අංක 36, 33, 62 හා 569. |

මොනරවිල කසුන් ප්‍රභාත් ආරියරත්න,
ප්‍රාදේශීය ලේකම්,
ගලේවෙල.

2021 පෙබරවාරි 23 වැනි දින.

12-522/2

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් මොනරවිල කසුන් ප්‍රභාත් ආරියරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1986.02.10 වැනි දින ප්‍රදානය කර ඇති අංක මාතලේ/ප්‍ර/6291 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන දේවහුව, මකුල්ගස්වැව පදිංචි ජයවීර වර්ධනගේ ලීලාවතී වෙත ප්‍රදානය කොට මාතලේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක වැ/132/1499/87 යටතේ 1987.09.24 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නිත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2022 ජනවාරි 03 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

මාතලේ පරිපාලන දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දපල්ල කෝරළේ මකුල්ගස්වැව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ වැටකොලුවැව නැමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, එෆ්. 59/25 භාරයේ ඇති සහ සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත අංක ග.සි. 382 දරන කට්ටි කැබීමේ පිඹුරේ 407 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම්කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්කර 00 රූඩ් 03 පර්චස් 29 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද වැටකොලුවැව ජනපදය නැමැති රජයේ ඉඩම :

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 408 හා 180 1/2, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 391 (පාර), |
| *දකුණට* | : | කැබලි අංක 406, |
| *බස්නාහිරට* | : | කැබලි අංක 409, 404 හා 92. |

මොනරවිල කසුන් ප්‍රභාත් ආරියරත්න,
ප්‍රාදේශීය ලේකම්,
ගලේවෙල.

2021 පෙබරවාරි 04 වැනි දින.

12-522/3

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් එස්. එන්. කේ. සේරසිංහ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1983.08.31 වැනි දින ප්‍රතිරූප අත්සන් කරන ලද අංක මාතලේ/ප්‍ර/1762 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන මාතලේ, පුරිජ්ජල, වරකාමුර බී ජනපදයේ, අංක 31 හි පදිංචි වීරප්පුලි මහරදාගේ එඩ්වින් වෙත නිකුත් නොකර මෙම කාර්යාලයේ රඳවාගෙන ඇති මාතලේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර නොමැති, පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නිත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2022.01.03 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මාතලේ පරිපාලන දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාතලේ කොහොන්සිය පත්තුවේ පුරිජ්ජල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පුරිජ්ජල නැමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 54/3/2(අයි20/4) දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි සර්වේ ජනරාල් වරයා විසින් සම්පාදිත අංක පි.පි.මා. 658 දරන පිඹුරෙහි අංක 31 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.109 රූඩ් - පර්චස් - ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම :

*උතුරට* : කැබලි අංක 28,
*නැගෙනහිරට* : කැබලි අංක 30,
*දකුණට* : කැබලි අංක 34,
*බස්නාහිරට* : කැබලි අංක 04 (පාර).

එස්. එන්. කේ. සේරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
උකුවෙල.

2020 නොවැම්බර් 04 වැනි දින.

12-522/4

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/65943.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :
එන්සීපී/පීඑල්සී/එල්2/දීකාබ.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි.**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 290, පුසියන්කුලම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පුසියන්කුලම කොට්ඨාසයේ ගමේ ඉඩම් නිලධාරී විසින් අඳින ලද අනුරේඛනයේ කැබලි අංක 01 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අක්කර 01 රූඩ් 01 පර්චස් 34 ක් වූ රජයේ ඉඩම් කොටස කෘෂිකාර්මික කටයුතු සඳහා හේරත්ගේ නලීන් අනුරුද්ධ මයා නමින් දීර්ඝ කාලීන බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

*උතුරට* : බිසෝ මැණිකාගේ ඉඩම හා මාර්ග රක්ෂිතය,
*නැගෙනහිරට* : මාර්ග රක්ෂිතය,
*දකුණට* : මාර්ග රක්ෂිතය,
*බටහිරට* : බිසෝ මැණිකාගේ ඉඩම හා මාර්ග රක්ෂිතය.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (2021.03.25 දින සිට වසර 30ක් ඉදිරියට).

*වාර්ෂික බදු මුදල*.- 2021 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු.5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි. ගරු ඇමතිතුමා අනුමත කළ වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල* .- අය නොකෙරේ.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඈ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම පළතුරු වගා ව්‍යාපෘතියක් සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඇ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඉ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදුද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඊ)* ගරු ඇමතිතුමා අනුමත කල දින සිට වසර පහක් ගතවන තුරු පවුල තුළ පැවරීම් හෝ මෙම ඉඩම බදුගත කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(උ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* නිවේදනය පළ කරන දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ඒ. කේ. එන්. සෙව්වන්දි අමරසේකර,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2021 දෙසැම්බර් මස 17 වැනි දින,
1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, ''මිහිකත මැඳුර'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

12-457

---

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/51903.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :
පළාත්/ඉකො/ඉ9/කල්/දී.බ.01.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 619 මාම්පුරිය ග්‍රාම නිලධාරි වසමේ මාම්පුරිය ගමේ පිහිටි නාවක්කාඩුවැල්ල හා මාම්පුරියවැල්ල නැමැති ඉඩමට මැනුම්පති විසින් පිළියෙල කරන ලද P. P. පු 4296 දරන සැලැස්මෙහි කැබලි අංක 02 මගින් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්: 1.336 ක් වූ රජයේ ඉඩම් කොටස හා අ.ග.පි. 3283 දරන සැලැස්මෙහි කැබලි අංක 652 මගින් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්: 4.0158 ක්වූ රජයේ ඉඩම් කොටස කෘෂිකාර්මික කටයුතු සඳහා වර්ණකුලසූරිය ප්‍රසාදි ජනිතා ලෝච් මිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

P.P. පු 4296 හි කැබලි අංක 02

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාම්පුරිය, |
| *නැගෙනහිරට* | : | ප්‍රාදේශීය සභා මාර්ගය, |
| *දකුණට* | : | නාවක්කාඩුවැල්ල, |
| *බටහිරට* | : | කැබලි අංක 01 (ප්‍රාදේශීය සභා මාර්ගය). |

අ.ග.පි. 3283 හි කැබලි අංක 652

| | | |
|---|---|---|
| *උතුරට* | : | 588, 594 වැනි කැබලි සහ ප්‍රාදේශීය සභා මාර්ගය, |
| *නැගෙනහිරට* | : | ප්‍රාදේශීය සභා මාර්ගය, |
| *දකුණට* | : | නවක්කාඩුව ගම, |
| *බටහිරට* | : | ප්‍රාදේශීය සභා මාර්ගය සහ 588 බිම් කැබැල්ල. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය.*- අවුරුදු තිහයි (30) (2021.10.17 දින සිට ඉදිරියට).

*වාර්ෂික බදු මුදල.*- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරු මත, 2021 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුද 05 අවසානයේ අයකළ මුදලින් 50% කට නොවැඩි විය යුතුය.

